
මගේ කුරුළු යාළුවෝ
තෙවිනි ගනේගොඩ

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත ” බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක ”ගොඩ නැගීම් අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ”ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකුරීමේ ප්‍රතිඵලයක ”ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක ” වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක ”ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “ දිවිය දිනන විද්‍යුත ”පොතක් “ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලද දරුවන්ට අතද්‍රැකීම් සමුදායක ” මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතවුන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක ”ලියන්නට සිහින දකනි දරුවන් සහෝදරතවයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත ” පොතක ”“ව්‍යාපෘතියට එක්ව පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතයි තුළින් ලැබුණු අතද්‍රැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශකත්යික ”වේවා යි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්ව අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමකුළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

අපේ ගෙදර මිදුලේ ලොකු අඹ

ගසක් තියෙනවා,ඒ අඹ ගසට එන

කුරුල්ලන්ට කන්න බත් දෙන

එක තමයි මගේ ආසම වැඩේ.



එක දවසක් මම දැක්කා කුරුළු

අම්මයි තාත්තා යි එකතු

වෙලා ලස්සන කුරුළු කූඩුවක්

හදනවා.



ටික දවසකින් බලද්දී කූඩුවේ

බිත්තර තුනක් තිබුණා.කුරුලු

අම්මා බිත්තර රකිනකොට කුරුලු

තාත්තා අම්මා ට කෑම ගෙනත්

දුන්නා.



කුරුලු ගෙදර ලොකු

කලබලයක්,බිත්තර වලින්

පැටවු  එලියට ඇවිත්,කුරුලු

අම්මාටයි තාත්තාටයි හරිම

සතුටුයි .ඒගොල්ලො ආදරෙන්

පැටවු බලාගත්තා.



දවසක් බූලා හයියෙන් බුරනවා ඇහුණා,කුරුල්ලෝ කලබල වෙලා කෑ ගහනවා,අපි ඉක්මනට මිදුලට දුවගෙන ගියා.අනේ සර්පයෙක් අඹ ගස දීගේ කුරුලු කූඩුව ලගට ඇදෙනවා.





අප්පච්චී ලීයකින් සර්පයාව බිමට දැම්මා,බූලා බුරන සද්දෙට බය වෙලා සර්පයා කැලේට රිංගා ගත්තා."ඇති යන්තම් කුරුලු පැටවු ටික බේරුනා" අම්මා කිව්වා .අපට ස්තූති කරන්න වගේ කුරුලු අම්මයි තාත්තයි අපි දිහා බලාගෙන හිටියා.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01



ISBN 978-624-206-753-7